# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1561 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 10/10/2024 පැය 0550

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.09.23 වන දින සවස් කාලයේ බියගම පොලිස් වසමේ මල්වාන හන්දිය අසලදී තියුණු ආයුධයකින් පහරදී මාබිම, හෙයියන්තුඩුව ලිපිනයේ පදිංචි පුද්ගලයෙකු ඝාතනය කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් වැඩිදුර විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව නිලධාරීන් විසින් මෙම ඝාතනයට සම්බන්ධ සැකකරු 2024.10.09 වන දින උදෑසන කාලයේ මල්වාන, පිඩලියවත්ත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන පිඩලියවත්ත, මල්වාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සහ සැකකරු අතර ඇතිව තිබූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය සිදු කර ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. ගම්පහ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයකට අවශකර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

2021.04.09 වන දින රාත්‍රි කාලයේ රුවන්වැල්ල පොලිස් වසමේ අංකර 50 රබර් වත්ත හරහා යමින් සිටි පුද්ගලයෙකුට පහරදී ගෙල සිරකර ඝාතනය කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය මඟින් විමර්ශනයක් ආරම්භකර තිබුණි. ඒ අනුව ගාල්ල, ගෝනපීනුවල ප්‍රදේශයේ දී මෙම ඝාතනයට සම්බන්ධ සැකකරු 2024.10.09 වන දින දහවල් කාලයේ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන ඌරුවල, ගලපිටමඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සහ සැකකරු අතර ඇති වූ පුද්ගලික ආරවුලක් මත මෙම ඝාතනය සිදු කර ඇති අතර ඝාතනයෙන් පසු සැකකරු විදේශ ගතව සිට 2022.09.19 වන දින නැවත මෙරටට පැමිණ ගාල්ල, ගෝනපීනුවලවල ප්‍රදේශයේ කාමරයක් කුලියට ගෙන සැඟව සිට ඇත. මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. සැකකටයුතු මරණයක් - මාවනැල්ල පොලිස් වසම.

2024.10.09 වන දින උදෑසන කාලයේ මාවනැල්ල පොලිස් වසමේ හිඟුල ප්‍රදේශයේ පිහිටි හෝටලයක කාමරයක් තුල පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මියගොස් ඇති බවට මාවනැල්ල පොලිස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ සිරි නිවස වත්ත, වැලිකන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත දේහය අසල ලේ පැල්ලම් කිහිපයක් ඇති බවට නිරීක්ෂණය වී ඇති අතර මරණකරු එම හෝටලයේ සේවකයෙකු ලෙස කටයුතු කර ඇත. මහෙස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කෑගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.10.09 වන දින රාත්‍රී කාලයේදී බොරැල්ල පොලිස් වසමේ මැගසින් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 35 මිලි ග්‍රෑම් 630ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන මැගසින්පාර, බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය.

2024.10.09 වන දින සවස් කාලයේදී පෑලියගොඩ පොලිස් වසමේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අනුස්මරණ පාලම අසලදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.10.09 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට හා වෙඩිකන්ද ප්‍රදේශවලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 250ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 400ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 54 වයස් වල පසුවන දෙහිවල හා රත්මලාන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.10.09 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 300ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.

2024.10.09 වන දින උදෑසන කාලයේදී පෑලියගොඩ පොලිස් වසමේ නවලෝක වටරවුම අසලදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 200ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන හේනමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - සියඹලාණ්ඩුව පොලිස් විශෙෂ කාර්ය බලකා කඳවුර.

2024.10.09 වන දින සවස් කාලයේදී ඇතිමලේ පොලිස් වසමේ නරියාය, පඩිතිස්දෙක ප්‍රදේශයේදී සියඹලාණ්ඩුව පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන්ට තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇතිමලේ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 46, 54 හා 61 වයස්වල පසුවන දොඹගලහවෙල හා ඕමල්පේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. පුරාවස්තු යැයි සැකකරන දේපල සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොල්පිතිගම පොලිස් ස්ථානය.**

2024.10.09 වන දින සවස් කාලයේදී පොල්පිතිගම පොලිස් වසමේ ඉරුදෙනියාය ප්‍රදේශයේ නිවසක පුරාවස්තු යැයි සැකකරන දේපල තොගයක් ඇති බවට පොල්පිතිගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු බවට සැකකරන විවිධ ප්‍රමාණයෙන් යුත් රතු පැහැති ගල් 04 ක්, අවර්ණ ගල් 05ක්, පැරණි කාසි 05ක්, තඹ සෙම්බුවක්, දෙහිගෙඩි හා මුහුදු වැලි අඩංගු කවරයක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 44 වයස්වල පසුවන මීගමුව හා පොල්පිතිගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පොල්පිතිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාඋල පොලිස් ස්ථානය.**

2024.10.09 වන දින සවස් කාලයේදී නාඋල පොලිස් වසමේ බඹරගහවත්ත ප්‍රදේශයේදී නාඋල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන බඹරගහවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාඋල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.10.09 වන දින සවස් කාලයේදී ජාඇල පොලිස් වසමේ ඒකල ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 33 මිලි ලීටර් 750 ( බෝතල් 45) සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන කුරුදුවත්ත, ඒකල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - වලපනේ පොලිස් වසම.**

2024.10.09 වන දින සවස් කාලයේ වලපනේ පොලිස් වසමේ මහනුවර වලපනේ මාර්ගයේ ආර්.ඩී.ඒ. හන්දිය අසලදී මහනුවර දෙස සිට වලපනේ දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගය අයිනේ නවතා තිබූ ත්‍රීරෝද රථයක ගැටී ත්‍රීරෝද රථය හා ලොරි රථය ඇදීගොස් මාර්ගයේ ගමන් කරමින් සිටි වයස අවුරුදු 07 ක පිරිමි ළමයෙකුගේ හා වයස අවුරුදු 15 ක ගැහැණු ළමයෙකුගේ ගැටී අනතුරුව මාර්ගයේ නවතා තිබූ තවත් ත්‍රීරොද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ළමුන් දෙදෙනා වලපනේ රෝහලට ඇතුලත් කිරීමේදී පිරිමි ළමයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 07 ක් වූ මුලහල්කැලේ, වලපනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වලපනේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වලපනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - පාදුක්ක පොලිස් වසම.

2024.10.09 වන දින සවස් කාලයේ පාදුක්ක පොලිස් වසමේ තුම්මෝදර ඉහල බෝපේ මාර්ගයේ පෙට්ටිගල බැවුම් ප්‍රදේශයෙදී තුම්මෝදර දෙස සිට ඉහල බෝපේ දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයේ පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු පාදුක්ක රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වූ දබෝර, තුන්මෝදර ප්‍රදේශයේ පදිංචි පාදුක්ක පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන ලද පොලිස් සැරයන් වරයෙකි.**

**මෘත** ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පාදුක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - පාදුක්ක පොලිස් වසම.

2024.10.09 වන දින දහවල් කාලයේ පාදුක්ක පොලිස් වසමේ කොළඹ අවිස්සාවේල්ල මාර්ගයේ තුන්නාන ප්‍රදේශයෙදී අවිස්සාවේල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දිසාවටම ඉදිරියෙන් ගමන්ගත් තවත් යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ඉදිරියෙන් ගමන්ගත් යතුරුපැදියේ පසු පැදිකාරිය බරපතල තුවාල ලබා පාදුක්ක රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 43 ක් වූ දබෝර, හංවැල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

**මෘත** ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පාදුක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**